# නිදිවරණ සඳවතිය

නිදිවරා රැය පුරා හිඳිනා
ගිලන් වූ සිත් එළිය කරනා
සත්කාරයෙන් පිදූ සඳවතිය
අරුණාළුව ගේ දොරට වඩිනා....

මසිත සිත් අහසෙ සැතපී
සොඳුරු බස් දොඩනා
සඳවතක් වූ ස්නේහයෙන්
කවක පද බඳිනා....

පමා වූ වසන්තය රැගෙන
වර්ණ සිත්තම් මවනා
තුරුණුවිය මුණගැසීනම්
අගේ යැයි සිතෙනා....

නුඹේ ගතිගුණ රැඳුනු
සම්පතක් දේද මට අගනා
ලෙන්ගතුය සුන්දරය
ආදරය දිනෙන් දින දැනෙනා....

සඳ සා පැටවූ සුරතලේ
ඔය උකුලෙ උණුහුමට හිඳනා
දකින්නට වාසනා නොලද මා
පින් මඳ ද සිතෙනා....

සැඳෑයම වේ නුදුරු
ජීවිතයෙ මද්දහනෙ ගෙවනා
හීන එකිනෙක අරන්
හැබෑවන දිනක් අගනා....

දිනෙක කවදා ද තනිවුනේ
අත්වාරු බිඳෙනා
හිඳින්නම් ලගට වී නුඹේ
දුක කඳුළ පිසිනා....

සැපක් වී නම් ගෙනෙන්නට
හිතේ දිරි නව තවද රැගෙනා
මතුභවෙත් නුඹ ලග හිඳින්නට
මා පෙරුම් පුරනා....



කල්දෙමුල්ල




| MONTH OF SHIPMENT | CUT OFF DATE | ESTIMATE DATE OF COLLECTIONS |
|---|---|---|
| JANUARY | 17.01.2015 | 23.02.2015 |
| FEBRUARY | 14.02.2015 | 23.03.2015 |
| MARCH | 01.03.2015 | 06.04.2015 |
| APRIL | 18.04.2015 | 25.05.2015 |
| MAY | 16.05.2015 | 23.06.2015 |
| JUNE | 13.06.2015 | 20.07.2015 |
| AUGUST | 15.08.2015 | 21.09.2015 |
| SEPTEMBER | 12.09.2015 | 14.10.2015 |
| OCTOBER | 17.10.2015 | 23.11.2015 |
| NOVEMBER(1) | 07.11.2015 | 10.12.2015 |
| NOVEMBER(2) | 14.11.2015 | 17.12.2015 |
| NOVEMBER(3) | 21.11.2015 | 04.01.2016 |
| DECEMBER | 12.12.2015 | 20.01.2016 |


**39 වන පිටෙන්**

සිතනවා.

කණ්ඩායමක් ලෙස වැඩ කරනවිට නොයෙකුත් ගැටළු සහගත තත්වයන්ට මුහුණ පෑමට සිදුවෙනවා. නමුත් කුසුම්සිරි මාමා සහ යශෝධරා නැන්දගෙන් අපට ලැබුණු පුහුණුව මෙම බාධක සියල්ල මැඩගෙන අපේ අරමුණ කරා ළඟාවීමට උපකාරයක් වුණා. ඔවුන් දෙපළ අපට දුන් ආදර්ශ නාට්‍ය නිර්මාණයට පමණක් නෙවෙයි අපේ මුළු ජීවිතයටම ආදර්ශයක් වෙනවා. රන්දුලා දියණිය ඇයගේ විද්‍යාවේදී උපාධිය හමාර කර දැනට මොනෑෂ් විශ්ව විද්‍යාලයේ පර්යේෂණ සහකාරක ලෙස වැඩ කරනවා. ආරම්භයේ පටන්ම සිටි, නාට්‍ය කණ්ඩායමේ තවත් අගනා සම්පතක් ලෙස ඇයව සඳහන් කරන්න පුළුවන්. නාට්‍ය පුහුණු වන ස්ථානයට ඈතින් වාසය කිරීමත්, මේ වන විට පූර්ණ රැකියාවේ යෙදීමත් හේතුවෙන් මුලදී මෙන් නාට්‍ය කලාවට කැපවී කටයුතු කිරීමට නොහැකිවීම ගැන ඇය කණගාටු වෙනවා.

## වහ

නිමාෂි පැල්පොල දියණිය අධ්‍යක්ෂණය කරන " වහ" නාට්‍යය, Kyogen සම්ප්‍ර දායට අයත් යන ජපන් බසින් නිර්මාණය වුණු, ආරිය රාජකරුණා විසින් සිංහලට පරිවර්තනය කර තිබෙන නාට්‍යයක්. ඒ පිළිබඳව ඇය අදහස් දැක්වුයේ මෙලෙසයි.

"මම මුලින්ම නාට්‍ය පාසලට සම්බන්ධ වුනේ වර්ෂ 2006 දී, වයලීන් වාදනයෙන් සංගීතය සපයමින්. සංගීතය සැපයීමෙන් ආරම්භවූ මගේ ගමන මේ වනවිට නාට්‍යයක් අධ්‍යක්ෂණය කිරීමේ තත්වය දක්වා ළඟාවීම ඔබට පුදුම සහගත දෙයක් වීමට පුළුවන්. නමුත් යශෝධරා නැන්දා සහ කුසුම්සිරි මාමා වැනි වචනයේ පරිසමාප්තියෙන්ම ගුරුවරුන් යැයි කිවහැකි යුවලකගේ මග පෙන්වීමත්, අප නාට්‍ය කණ්ඩායමේ ඇති තිරසාර බැඳීමත්, අනොන්‍ය සහයෝගයත් අත්දකින කෙනෙකුට එය අමුතු දෙයක් නොවෙන බව පේනවා. අපි සැම එකමුතුවී වැඩ කරන්නේ හරියට එකම පවුලක සාමාජිකයින් වගේ.

මෙම නාට්‍යය අධ්‍යක්ෂණය සඳහා කුසුම්සිරි මාමා මට යෝජනා කල වෙලාවේ මම මුලින්ම පසුබෑවා. නමුත් නාට්‍යයේ පිටපත කියවූ පසු ජපන් සංස්කෘතිය වැනි අගනා සංස්කෘතියකින් රංග කලාවට දායක කල හැකි රසාස්වාදය මට පෙනුණා. එය ශ්‍රී ලාංකීය සංස්කෘතියට වැඩ වෙනස් වුවත්, දෙබස් සහ චරිත හැසිරවීමේදී විවිධ ශෛලීන් අත්හදා බැලීමට මට හැකි වුණා. මගේ නාට්‍ය සමන්විත වන්නේ නළු නිළියන් හතර දෙනෙකුගෙන් විතරයි. ඔවුන් හතර දෙනාගෙන් ලැබුණු අදහස්, නිර්මාණශීලීත්වය සහ කැපවීම මගේ නිර්මාණය සඳහා විශාල අත්වැලක් වුණා"

මේ වන විට ඇය ඩීකින් විශ්ව විද්‍යාලයේ කළමනාකරණ උපාධිය (සංචාරක ව්‍යාපාරය පිළිබඳ) හමාර කර තිබෙනවා. ඇය NishRoo නමින් ඇගේම ඡායාරූපාගාරයක් පවත්වාගෙන යන දක්ෂ ඡායාරූප ශිල්පිණියක්ද වෙනවා. සංගීතය පිළිබඳව ඇති උනන්දුවත්, කළමනාකරණයට ඇති මනා දක්ෂතාවත් සඳහා ඇය ප්‍රසිද්ධයි.

**අවසාන වශයෙන් හාර පංගු නිර්මාණයට දායක වුවන් වෙනුවෙන් හාර පංගු නැරඹීම සඳහා ඔබ සැමට කාරුණික ආරාධනයක් කෙරෙනවා. හාර පංගු යනු තවත් ළමා නාට්‍ය හතරක් නොවෙන බවත්, එකිනෙකට වෙනස් සංස්කෘතීන් සහ සම්ප්‍රදායන් ගෙන් අනුවර්තනය කර ගන්නා ලද නිර්මාණ බවත් මෙහිදී නැවත මතක් කිරීමක් කරනවා.**

**හාර පංගු කරලියට එන්නේ, අගෝස්තු මස 22 වෙනි සෙනසුරාදා සවස 6.30 ට, ක්රැන්බර්න් ප්‍රජා රඟහලේදීයි.**
(Cranbourne Community Theatre" Brunt St" Cranbourne VIC 3977).